# අභිලේඛනවලින් හෙළිවන පුරාණ පරිසර සංරක්ෂණය

ආර්.එම්. එස්.එස්.රත්නායක

පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
*sagarikasandamali0621@gmail.com*

**ප්‍රමුඛ පදඃ** ශිලා ලේඛන, සංරක්ෂණය , පරිසරය ,තිරසාර සංවර්ධනය

**හැඳින්වීම**

මානව පරිණාමයත් සමඟ ඇති වූ ජනගහන වර්ධනය හා ඔවුනට අවශ්‍යය ආහාර සපුරා ගැනීමේදී මිනිසා පරිසර සම්පත් ප්‍රයෝජනයට ගැනීමට පෙළඹිණි .පරිසර සම්පත් භාවිතයේ දී අතීත මිනිසා එම සම්පත්වලින් ප්‍රයෝජන ලබමින්, එම සම්පත් අනාගත පරපුර සඳහාද ආරක්ෂා කරන ලදී .ඒ බවට විශ්වීයව හා දේශීයව දැකගත හැකි ඓතිහාසික ශාක්ෂ්‍යය පවතී. බුදුන් වහන්සේගේ පරිසරය පිළිබඳ දේශනා, රතු ඉන්දියානු ගෝත්‍ර නායක සියැටල්ගේ පරිසරය පිළිබඳ දර්ශනය, මෙන්ම ශ්‍රී ලංකාවේ විශේෂ රජෙකු වූ පරාක්‍රමබාහු රජුගේ ජල ප්‍රතිපත්තිය වැනි දෑ ඒ අතර ප්‍රකට වේ. වර්තමානයේ පිළිගන්නා  තිරසාර සංවර්ධන සංකල්පය හෙවත් පාරිසරික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් අනාගත පරපුර සඳහා ආරක්ෂා කිරිමේ සංකල්පය අතීත ලංකාවේ පැවති පරිසර සංරක්ෂණ ක්‍රියාමාර්ග මඟින් මනාව ප්‍රකට වේ.

මෙහිදී අවධානය යොමු කරන්නේ  , ශ්‍රී ලංකාවේ ශිලාලිපි උපයෝගී කරගනිමින් අතීත ලංකාවේ පරිසර සංරක්ෂණ කටයුතු සිදුවී ඇති ආකාරය අධ්‍යයනය කිරිමටය. බොහෝමයක් ශිලාලිපිවලින් ආගමික තොරතුරු අනාවරණය වුවත් , ද්විතීයික වශයෙන් පාරිසරික තොරතුරුද අනාවරණයට ලක් වේ. ඒ අනුව පරිසර සංරචක ආරක්ෂා කරමින් , සමස්ත පරිසර සංරක්ෂණයට දායක වූ ආකාරය ශිලාලිපි ඇසුරින් අනාවරණය කරගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යනය සිදුකිරිමේ දී දත්ත එකරාශි කරගැනිම සඳහා අභිලේඛන මූලාශ්‍රය අන්තර්ගත ද්විතියක මූලාශ්‍රය අධ්‍යයනය සිදුකළ අතර , ක්ෂේත්‍ර ගවේශනය මඟින් ලබාගත් දත්ත ද සංසන්දනාත්මක ව අධ්‍යනය කර මෙහි ඉදිරිපත් කර ඇත. පර්යේෂණයේ සීමාව ලෙසට ක්‍රි පූ 3 වන සියවසේ සිට ක්‍රි ව 13 වැනි සියවස දක්වා කාලයට අයත් ශිලා ලේඛන උපයෝගී කරගනු ලැබීය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පරිසර සංරක්ෂණය උදෙසා අතීත මුතුන්මිත්තන් ක්‍රියාකළ ආකාරය පිළිබඳව විමසා බැලීම කාලෝචිත වේ.මුතුන්මිත්තන් ලංකාවේ ශ්‍රී විභූතිය දක්වනු වස් නිමැවූ හෙළ කලාශිල්පයන්ට සමගාමීව, පරිසරය හා ජනගහනය අතර සමතුළිතතාවක් ගොඩනඟා ගැනීමට සමත් විය. අතීත රජවරු විසින් පරිසරය ආරක්ෂා කර ගැනීමේදී නීති රීති පැනවූ බවට සාක්ෂ්‍යය තිබේ .ගහකොලවල වන සතුන්ගේ ආරක්ෂාවට ආගමික පසුබිම තුළ වැඩි අගයක් ලැබී තිබේ. සංසරත්නය සඳහා ප්‍රභූන් පූජාකර ඇති ගල්ලෙන්

රාශියක් පිළිබඳව ශිලාලිපි සාක්ෂ්‍යය දරයි. වත්මන් ආරණ්‍යය සේනාසන ආශ්‍රිතව වන බිමක් දක්නට ලැබීමත් එකල භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලද ගල්ලෙන් ආශ්‍රිතව ද වන බිම් තිබූ බවටත් ඒවා ආරක්ෂා කර ගැනීමට නීති රීති පැනවූ බවත් සංසගත දැ මිනිසාගේ අතපෙවීමකින් තොරව නිර්මලව පැවති බවට තොරතුරු දැක්විය හැකිය.

අම්පාර උහන ගල්ඔය සෙල්ලිපියෙන් කුබීර නම් තෙරණු කෙනෙකු හට එම වනය පූජාකර ඇති බව දැක්වේ.

" කුබිර තෙරහ වනෙ" (කුබීර (කුවේර) තෙරුන්ගේ වනයයි) (සිංහල ශිලාලේඛන සංග්‍රහය. NO: 469.)

වවුනියාව දිස්ත්‍රිකයේ මහකච්චට්කෝඩි ශිලාලිපියේ දැක්වෙන පරිදි"බත අබයහ ලෙනෙ ශගශ"(භර්තෘ අභය ගේ ලෙන සංඝයාටය) (සිංහල ශිලාලේඛන සංග්‍රහය. NO: 325.)

සිතුල්පව්ව කොරවක්ගල ඇති ශිලා ලිපියක් වන, ගුතහ මහලෙණෙඅගත - අනගත චතුදිශ -ශගශ(සිංහල ශිලාලේඛන සංග්‍රහය. NO:646.)

වශයෙන් දැක්වෙන්නේ සතර දිග සංඝයාට මෙම ලෙන් පූජා කළ බවත් ඒවා බොහෝ විට වනබද ප්‍රදේශවල ස්ථාපිතව තිබූ බවත් ය. ආගමික වශයෙන් මිනිසුන් තුළ ඇති භක්තිය එයට බලපාන්නට ඇතැයි උපකල්පනය කළහැකිය .ඒ හේතුවෙන් ලෙන් ආශ්‍රිත පරිසරය සංරක්ෂණය වූ බවට සාධක අද වන විටද මිහින්තලේ රාජගිරි කන්ද ලෙන ආශ්‍රයෙන් දක්නට ලැබේ.

බුද්ධ භෝග විනාශයට පත් කිරීම නිසා බලු කවුඩු වීමට ශාප කිරීම වැනි මිනිසාගේ චින්තනයට කරන කාවැද්දීම තුළ පරිසරය සංරක්ෂණය සිදුවන්නට ඇත .

iv වැනි කාශ්‍යපප රජුගේ මොරගොඩ ලිපිය තුළ"....මේ ආන්නැ උලසන කළ කෙනෙක් ඇත්නම් කවුඩු බලු වෙත්වා ..."(අභිලේඛන ශාප පාඨ. පි .03)

vවැනි කාශ්‍යපප රජු විසින් කරවන ලද අභයගිරි පුවරු ලිපිය (ක්‍රි ව 929-939 පේළිය 15-19) තුළ අභයගිරි වෙහෙරට හා චේතියගිරි විහාරයට අයිතියක් ඇති විහාරයේ වූ ගම් බිම් වලටද ආබද්ධ වූ විහාරවලටද රජමහාවිහාර පිරිවෙන් භාවනා ගෘහ මෙහෙණි ආරාමවලටද සංඝයා සතු සියලු ගම්වලට අයත් ගස් කොලන් නොකැපිය යුතු බවට නීතියක් පනවා තිබේ. මිහින්තලා පුවරු ලිපියේ පළමු ලිපියේ වතු සහ කුඩා වතුවල ගස් කොලන් නොකැපිය යුතු බවත් මී ගස් හා තල් ගස් ආදී එල හට ගන්නා ගස් කොලන් නොකැපිය යුතු බවත් දක්වා තිබේ.

පරිසර සංතුලනයට දායකවන සතුන්ගේ ආරක්ෂාව සඳහා කටයුතු කළ අයුරු පිළිබඳ අධ්‍යනය කිරීමේදී

ක්‍රි ව 2 වැනි සියවසේ නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපිය වැදගත් වේ.

"කොටැ නුවරට හාත්පසින් සත් ගව්වක් පමණ තැනැ හැම සතුන් නොමැරිය හැක්කැයි අභය දී..." (ලක්දිව සෙල්ලිපි . පි.281)

සතුන්ට අභය දානය දීම හා නුවරට හත් ගව්වක් දුර සතුන් නොමැරිය යුතු බවත් මසුන් හා පක්ෂීන්ටද අභය දානය දිය යුතු බවත් එහි දක්වා තිබේ.

දහවැනි සියවසට අයත් කතෘ අඥාතක අනුරාධපුර ගල් ඔරුවේ සන්නසක් මගින් එළුවන් මැරීම වරදක් ලෙස දක්වා

තිබේ.''හවුතියේ එළු මැරුවා ක-''(ලක්දිව සෙල්ලිපි . පි. 280)

iv වැනිමිහිදු රජු (ක්‍රි ව 956-972) රජ වීමෙන් පසු කරවන ලදැයි සලකන වේවැල්කැටියේ සෙල්ලිපියේ මී හරක් එළ හරක් හා එළුවන් මරා දැමුවහොත් සංසිඳවීම කොටද නොමරා සොරකම් කරගෙන ගියහොත්

සොරුන්ගේ කිහිල්ලේ හණ ගසා බැහැර කිරීමද කරන බව දක්වා තිබේ. ඊට අමතරව දඹුලු ගිරිලිපියේද සතුන් මැරීම තහනම් කර තිබේ.

ක්‍රි ව 10 වැනි සියවසේ iv වැනිමිහිදු රජතුමාගේ අභිෂේකයෙන් 9වන වස බිනර මස අවපස 10 වැනි දින ලියැවුනු වෙස්සගිරි පුවරු ලිපියෙහි දැක්වෙන පරිදි ඔයෙන් එගොඩ මෙගොඩ විහාරය හාත්පස කැබලි නොකර ගැනීමද කුඹුරුවලට අවශ්‍යය ජලය පාලනය පිළිබඳවද දක්වා තිබේ එ මඟින් ජලය සංරක්ෂණය කළ අයුරු දක්නට ලැබේ.

මෙසේ බලන කළ අතීත මුතුන් මිත්තන්ගේ අරමුණ වී ඇත්තේ පරිසර සම්පත් රැක ගැනීම හා ඒවා සංරක්ෂණය කිරීම බව අධ්‍යයනයෙන් පැහැදිළි වේ. නීති රීති පැනවීම හා ශාප පාඨ දැක්වීම තුළින් උපාය මාර්ගිකව සංරක්ෂණය කළ ආකාරයද ඉන් පැහැදිළි වේ .

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධනපාල, ඒ.එච්. (2010)***පරිසර විනාශය හා සංරක්ෂණය.*** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අමරවංශ හිමි, කොත්මලේ. (1969)***ලක්දිව සෙල්ලිපි.***කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ,එන්. (2000)***සිංහල ශිලාලේඛන සංග්‍රහය.*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතුංග, ටී.ජී. (2005)***අභිලේඛන ශාප පාඨ.***මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.